ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය. 2010

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1:1 **මතය**

--------

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.2. **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.**

---------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර.)**

-----------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) පෙර වර්ෂවලට අදාල ගිණුම්කරණ දෝෂ නිවැරදිකිරීම සඳහා ශ්‍රී.ල.ගි.ප්‍ර. අංක 10 ට අනුව අදාල වර්ෂවල මූල්‍ය ප්‍රතිඵලවලට ගැලපීම වෙනුවට, පූර්ව වර්ෂ ගැලපුම් ලෙස හඳුනාගත් රු.31,846,758 ක හර හා රු.31,085,990 ක බැර ශේෂයන එකිනෙකට හිලව්කර ශුද්ධ අගය වූ රු.760,768ක් සමාලෝචිත වර්ෂය තුළදී රඳවාගත් ඉපැයුම්වලට ගලපා තිබුණි. තවද, මෙම පූර්ව වර්ෂ ගැලපීම් ප්‍රමිත අනුව අනාවරණය කර නොතිබුණි.

(ආ) වත්කම් ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් ශ්‍රී.ල.ගි.ප්‍ර. අංක 18ට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

(i) 41ඡේදය - රු.8,085,836,773 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතයෙන්, ප්‍රයෝජනයට ගන්නා වත්කම් සඳහා උපලබ්ධි වූ අතිරික්තය රඳවාගත් ඉපැයුම් වලට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) 77 ඡේදය - සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් වල වටිනාකම රු.5,797,800 කින් වැඩිකර එය ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද ඊට අදාලව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු තොරතුරු හෙළිදරව් කර නොතිබූ අතර ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයේදී සිදුවී තිබූ දෝෂ ප්‍රවර්තන වර්ෂයේදීද නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) අඩුවෙන් /වැඩියෙන් දැක්වීම්**

(i) දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය මගින් 2004 - 2010 කාලපරිච්ඡේදය තුළ රු.2,348,752,669 ක් වූ ස්ථාවර වත්කම් ආධාර වශයෙන් විශ්වවිද්‍යාලයට ලබා දී තිබූ අතර එයින් රු.2,320,454,170 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) ආයෝජන ආදායම් පොලිය නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන් ආයෝජන 06 ක් සඳහා පොලිය රු.6,851 ක් අඩුවෙන්ද ආයෝජන 14 ක් සඳහා පොලිය රු.211,157 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(iii) සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන සැලසීමේදී අවුරුදු 05 ට අඩු සේවා කාලයක් සහිත සේවකයන් වෙනුවෙන් ප්‍රතිපාදන නොසැලසීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී සේවක පාරිතෝෂික ප්‍රතපාදනය රු.5,135,218 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ) අනුචිත හෙළිදරව් කිරීම්**

(i) ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලක ගොඩනැගිලි අයදුම්පත අනුමත කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබූ රු.720,000 ක සේවා ගාස්තුව කෙරීගෙන යන වැඩ ලෙස සටහන් කිරීම වෙනුවට නාවල ප්‍රධාන කාර්යාලිය ගොඩනැගිලි යටතේ ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.

(ii) 2010 වර්ෂය තුල ඉදිකිරීම් අවසන් කර භාවිතයටද ගෙන තිබූ විභාග ශාලාව - II අදියර වෙනුවෙන් දරන ලද වියදම වූ රු.61,755,419 කෙරිගෙන යන වැඩ ලෙස දක්වා තිබූ අතර මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ක්ෂය රු.3,087,771 කින් අඩුවෙන් ගිණුම් ගතවී තිබුණි.

### 1.2.3. නොසැසඳු වෙනස්කම්

විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයෙන් ලැබිය යුතු ශේෂය රු.335,520 ක් වුවද එම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂය රු.261,810 ක් විය. රු.73,710 ක් වූ වෙනස සසඳා ගිණුම් නිවැරදි කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නිති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගිමේ බදු පනතේ 02 (1)(ඇ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී ජාතිය ගොඩනැගිමේ බදු හා ආර්ථික සේවා ගාස්තු ගෙවීමේදී රු.37,425,452 ක් වූ පාඨමාලා ගාස්තු ආදායම් හා රු.2,276,328 ක් වූ කෙටිකාලීන පාඨමාලා හා ප්‍රායෝගික පුහුණුවීම් සඳහා වූ ලැබීම් සැලකිල්ලට නොගැනිම හේතුවෙන් දේශිය අදායම් කොමසාරිස්ට ගෙවිය යුතු එකතුව රු.1,290,308 ක් වූ බදු මුදලක් අඩුවෙන් ගෙවා තිබුණි. |
| ආ) 2003 ජුනි 22 එන හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 ජේදය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

ඇ) මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (i) මු.රෙ. 139 හා 261 | මුදල් පොත අනුව බැංකු ජංගම ගිණුම් 02 ක ශේෂ ඉක්මවා එකතුව රු.1,810,850 ක් වූ චෙක්පත් නිකුත් කර තිබුණි. |
| (ii) මු.රෙ. 371 (2) (ආ) | 1. සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂය තුල අවස්ථා 73 කදී රු.20,000 ට වැඩි තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස රු.4,212,989 ක් ලබාදී තිබූ අතර ඉන් අවස්ථා 32 කදී ලබාදී තිබූ අත්තිකාරම් වල වටිනාකම රු.50,000 සිට රු.500,000 දක්වා විය.<br>2. නිසි පරිදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා අවස්ථා ගණනාවකදී දී තිබූ අත්තිකාරම් වලින් 50% වැඩි ප්‍රමාණයක් ඉතිරි වී තිබීමද, අත්තිකාරම් පියවීමේ දීර්ඝ ප්‍රමාදයන්ද, කලින් ලබා දුන් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් නිකුත් කිරීමද යනාදි කරුණු නිසා අත්තිකාරම් සම්බන්ධව පැවති අභ්‍යන්තර පාලනය දුර්වලව තිබුණි. |
| (iii) මු.රෙ. 570 සහ 571 | රු.31,527,719ක් වූ වර්ෂ 2 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබූ අතර ඒවා තිරවුල් කිරීමට හෝ රාජ්‍ය ආදායමට ගැනිමට හෝ කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ.1645 | විශ්වවිද්‍යාල සතු වාහන 25 සම්බන්ධයෙන් ක්‍රමවත්ව හා යාවත්කාලීනව ලොග් සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXVI වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා මු.රෙ. 757 (ඇ) (2) | ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. |

1.2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවු ගනුදෙනු

-----------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 879 හි විධිවිධාන වලින් බැහැරව නඩත්තු අංශයේ කම්කරුවන්ට ගෙවන වැටුප, ශිල්පීය කම්කරුවෙකුට රු. 800 ක් හා ශල්පීය නොවන කම්කරුවෙකුට රු.600 ක් ලෙස පාලක මණ්ඩලය විසින් තීරණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට අගෝස්තු දක්වාවූ මාස 06ක කාලපරිච්ඡේදය සඳහා රු.144,824 ක් කම්කරු වැටුප් ලෙස වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා විශ්‍රාම වැටුප් දායක අරමුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව සැලකිල්ලට නොගත යුතු බවට අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003 ජූලි 18 දිනැති අංක බිඩී / අයි එන් එස් / සී /එල් එන් ඒ / 078 දරණ ලිපියෙන් දන්වා තිබුණද එම දීමනාව සඳහාද දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,877,358ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) 1994 ජූනි 14 දින හා අංක 95 දරණ භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇමතු අංක බිඩී/පිඊ1/174/11 දරණ ලිපියට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනාව ලෙස රු.1,163,755 ක මුදලක් ගෙවා තිබුණි.

02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------------

2.1 මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.254,632,295 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ඌණතාවය රු.335,769,254 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,136,959 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වියදම රු.97,951,034 කින් වැඩි වී තිබුණද පාඨමාලා ආදායමද රු.153,420,309 කින් වැඩි වී තිබීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 2.2.1. කාර්ය සාධනය

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයනාංශ 04 ක් මගින් පාඨමාලා 56 ක් පවත්වනු ලබන නමුත් කළුතර අධ්‍යයන මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන්නේ ඉන් පාඨමාලා 04 ක් පමණක් වන අතර ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 240 කි.

(ආ) විශ්ව විද්‍යාලයේ එක් එක් අධ්‍යයනාංශ යටතේ වාර්ෂිකව ආරම්භ කිරීමට යෝජිත පාඨමාලා/ වැඩසටහන් හා අයදුම්පත්‍ර නිකුත් කිරීමේ කාලසටහනක් නිකුත් කර ඇති නමුත් වර්ෂය තුළ අයදුම්පත්‍ර නිකුත් නොකල පාඨමාලා/ වැඩසටහන් 17 ක් ද, අයදුම්පත්‍ර නිකුත් කිරීම කාලසටහනේ සඳහන් කාලයට වඩා සැලකිය යුතු ලෙස ප්‍රමාද කල අවස්ථා 14 ක් ද නිරීක්ෂණය විය.

(ඇ) පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීමේදි අලෙවි කල අයදුම්පත්‍ර සංඛ්‍යාව නොසලකා අලෙවියට භාරදී ඇති අයදුම්පත්‍ර සංඛ්‍යාව අනුව විභාග කටයුතු සංවිධානය කිරීම නිසා ඒ සඳහා නිෂ්කාර්ය වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ඈ) ප්‍රාදේශිය අධ්‍යයන මධ්‍යස්ථාන වල විභාග පිළිතුරුපත් හා ඉතිරි ප්‍රශ්න පත්‍ර හැකි ඉක්මණින් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර රත්නපුර හා කළුතර අධ්‍යයන මධ්‍යස්ථාන වල පිළිතුරුපත් හා ඉතිරි ප්‍රශ්න පත්‍ර එවීම සඳහා පිළිවෙලින් දින 05 සිට 09 දක්වා සහ දින 05 සිට 06 දක්වා කාලයක් ගතවී තිබුණි.

(ඉ) 2007 වර්ෂයේ සිට ආරම්භ කිරීමට නියමිතව තිබූ අධ්‍යාපනවේදි (නාට්‍ය හා රංගකලාව) උපාධිය සමාලෝචිත වර්ෂය දක්වා ආරම්භ කර නොතිබුණි. මෙම උපාධිය ටවර් රඟහල පදනම මගින් ක්‍රියාත්මක කරන නාට්‍ය හා රංග කලාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව සමත් වූවන් බඳවා ගැනීම ඉලක්ක කරගෙන ආරම්භ කල යුතු වූවක් වන අතර, මේ වන විට එම ඩිප්ලෝමාව සමත් කාණ්ඩායම් 02 ක් මෙම උපාධිය සඳහා ලියාපදිංචි වීමේ අපේක්ෂාවෙන් සිටින බව නිරීක්ෂණය විය.

(ඊ) 2006 - 2010 සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම හා 2010 ක්‍රියාකාරි සැලැස්ම අවශ්‍යතා අනුව යාවත්කාලීන කර නොතිබුණි. 2010 ක්‍රියාකාරි සැලැස්ම මගින් ඉටුකල යුතු බවට කාර්යන් 141 ක් නියම කර තිබුණද කාර්යන් 77ක ප්‍රගතිය සම්බන්ධව තොරතුරු විගණනය වෙත වාර්තා නොකෙරුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද කාර්ය සාධන වාර්තා අනුව කාර්යන් 18 ක කාර්ය සාධනය සම්බන්ධයෙන් තොරතුරු ප්‍රමාණවත්ව ඉදිරිපත් නොකෙරුණු අතර කාර්යයන් 15ක් ඉටුකර නොතිබුණි.

2.2.2 **මතභේදයට තුඩුදෙන කරුණු**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුද්‍රණාලයේ ලිතෝ මුද්‍රණ කටයුතු සැලසුම් කිරීම සඳහා ලිතෝ ශිල්පීන් තිදෙනෙකු සිටියදී එම කාර්යයන් මුදල් ගෙවා පිටතින් ඉටුකර ගැනීම හේතුවෙන් ඔවුන්ට වාර්ෂිකව වැටුප් හා ජීවන වියදම් දීමනා වශයෙන් ගෙවනු ලබන රු.මිලියන 1.25 ක් නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

(ආ) මුද්‍රණ කටයුතු සඳහා ලිතෝ මුද්‍රණ ශිල්පීන්ගේ සේවය කාර්යක්ෂම අයුරින් භාවිතා නොකර රිසෝ යන්ත්‍ර භාවිතා කිරීම, පොත් බැඳීම සඳහා කොළ එකතු කිරීමට යන්ත්‍රයක් තිබියදී එය භාවිතා නොකිරීම යනාදීය හේතුවෙන් මුද්‍රණාලයේ අතිකාල හා කැලි ගෙවීම් සඳහා විශාල මුදලක් වැයකර තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මුද්‍රණාලයේ අතිකාල හා කැලි ගෙවීම් සඳහා වැයකර තිබු මුදල රු.6,486,611 ක් වූ අතර ඇස්තමේන්තු කල මුදල රු.2,555,000 ක් විය. 2009 වර්ෂය සඳහා මෙකී වියදම රු.3,881,065 ක් හා ඇස්තමේන්තුව රු.2,000,000 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා මුද්‍රණාල අතිකාල වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව 67% කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කාර්ය වෘත්තීය මට්ටමින් සිදුකර නොතිබියදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය හා ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ රඳවා ගැනීම් මුදල වූ රු.139,500 අදාල කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

## 2.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

### (අ) මූල්‍ය පාලනය

--------------------

(i) තොරතුරු තාක්ෂණ සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් 2004 වසරේ සිට අවස්ථා 04 කදී වරින් වර ලැබුණු රු.6,772,854 ක මුදලින් රු.6,647,654 ක මුදලක් එනම් 98.2% ක් කිසිදු ඵලදායි කටයුත්තකට නොයොදවා නිෂ්කාර්යව තිබුණි.

(ii) එකතුව රු.114,884,209 ක් වූ විවිධ අරමුදල් 151 ක් පිහිටුවා තිබූ අතර ඉන් කටයුතු අවසන්ව තිබූ හා අතහැර දමා තිබූ ගිණුම් ශේෂ ආදායමට ගැනිමට කටයුතු කර නොතිබුණි.

(iii) 1. වර්ෂ 15 කට වඩා පැරණි ශේෂ ඇතුලත් රු.88,695 ක් වූ නොපියවූ සුළු මදල් අග්‍රිම ශේෂ අයකර ගැනිමට කටයුතු නොකර අත ඉතිරි මුදල් ලෙස ගිණුම් වල දක්වා තිබුණි.

2. විශ්වවිද්‍යාලයේ අනුරාධපුර, කළුතර හා වවුනියාව යන අධ්‍යයන මධ්‍යස්ථාන වලද, ප්‍රධාන කාර්යාලයේ ඇතැම් අංශ වලද සියළු විස්තර ඇතුලත් සුළු මුදල් පොත් පවත්වාගෙන නොයාම, සුළු මුදල් වවුචර් භාවිතා නොකිරිම, වියදම් ප්‍රතිපූර්ණය පමා වීම, වියදම් සීමාව ඉක්මවා සුළු මුදලින් වියදම් දැරීම, ආරක්ෂිතව මුදල් තබා නොගැනිම වැනි අඩුපාඩු නිසා ඒ පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වලව පැවතුණි.

### (ආ) පරිගණක දැනුවත් කිරීම පිළිබඳ වැඩසටහන

------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදිද පරිගණක දැනුවත් කිරිමේ වැඩසටහන සඳහා MS Office 2003 පැකේජය භාවිතා කර තිබූ අතර ඒ වන විට නිකුත්ව තිබූ MS Office 2007 පැකේජය ඒ සඳහා යොදාගැනිම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) **විභාග ශාලාව (II අදියර) ඉදිකිරීම**

----------------------------------------

(i) විභාග ශාලාව (II අදියර) ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී තෝරාගත් කොන්ත්‍රාත්කරු, තිබිය යුතු අවම සුදුසුකම් වූ පසුගිය වසර 05 තුල නිමකල කොන්ත්‍රාත් වල වටිනාකමේ වාර්ෂික සාමාන්‍යය රු.මිලියන 41 ක් වත් විය යුතු බවට හා තිබිය යුතු අවම ජංගම වත්කම් හෝ ණය පහසුකම් ප්‍රමාණය රු.මිලියන 07 ඉක්ම විය යුතු බවට වූ අවශ්‍යතා සපුරා නොතිබූ අතර සිවිල් ඉංජිනේරු, අධීක්ෂක (සිවිල්) හා ප්‍රමාණ සමීක්ෂක යන කාර්ය මණ්ඩලයේ සුදුසුකම් හා පළපුරුද්ද නියමිත කොන්දේසි වලට අනුකූලද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

(ii) 1. කොන්ත්‍රාත්තුව සම්බන්ධව වසරක නඩත්තු කාලයද ආවරණය වන පරිදි කාර්යසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතු වුවද ඉදිරිපත් කර තිබූ සුරක්ෂණයෙන් ආවරණය වී තිබුණේ මාස 02 දින 20 ක් පමණක් විය.

2. කොන්ත්‍රාත් වටිනාකමෙන් 10% ක් ඉක්මවූ වටිනාකමට ඉදිරිපත් කල යුතු රක්ෂණ ආවරණය ඉදිරිපත් කර නොතිබුණි.

2.2.4 **නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු.27,976,559 ක් වූ විද්‍යාගාර උපකරණ 10 ක් හා වටිනාකම නිවැරදිව තක්සේරු කිරීමට තොරතුරු නොමැති ගණිත හා පරිගණක විද්‍යාගාරයේ ඡායා පිටපත් යන්ත්‍රයක් හා කාර්යාල උපකරණ ප්‍රමාණයක්ද වසර 2කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) කළුතර අධ්‍යයන මධ්‍යස්ථානයට ලබා දී තිබූ පරිගණක විද්‍යාගාරය, ශ්‍රවනාගාරය, ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය, කාර්යාල උපකරණ 37 ක් සහ ජෙනරේටරයක්ද, රත්නපුර අධ්‍යයන මධ්‍යස්ථානයට ලබාදී තිබූ ඩීසල් ජෙනරේටරයක්, රූපවාහිනී 03 ක්, වතුර මෝටරයක්ද වසරකට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණ.

(ඇ) විශ්වවිද්‍යාලීය තාවකාලික නේවාසිකාගාරයේ ඇති උපකරණ 22 ක් ක්‍රියාවිරහිතව ද, උපකරණ 36 ක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයේද පැවතුණි.

2.2.5 හඳුනාගන්නා ලද පාඩු

--------------------------

ශිෂ්‍යත්ව සඳහා විදේශගත වූ කථිකාචාර්යවරුන් 06 දෙනෙකු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් ඔවුන්ගෙන් අයකර ගත යුතු එකතුව රු.3,664,190 ක මුදල අයකර ගැනීම සඳහා ගිවිසුම් කඩකල දිනයේ සිට වසර 10 ක් ඇතුලත නඩු පැවරීමට කටයුතු නොකිරීම හේතුවෙන් එකී මුදල විශ්වවිද්‍යාලයට අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

2.2.6 කාර්ය මණ්ඩලය

----------------------

ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන හා අධ්‍යයන මධ්‍යස්ථාන වල කටයුතු ප්‍රමාණවත් වැඩ බෙදීමක් සහ වගකීමක් සහිතව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොවීම හේතුවෙන් කළමනාකරණ සහකාර හෝ ඊට ඉහළ නිලධාරීන් ඉටුකල යුතු රාජකාරි කම්කරුවන්ට භාරදී තිබීම හා අධීක්ෂණය නොකිරීම, ස්ථිර නිලධාරීන්ට පැවරිය යුතු මූල්‍ය හා අනෙකුත් වත්කම් භාර කටයුතු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන්ට පවරා තිබීම, ලිඛිත වැඩ පැවරීම් රහිතව වාචික උපදෙස් මත රාජකාරි ඉටුකිරීම, නිලධාරීන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් වලට චෙක්පත් නිකුත් කිරීම හා නිලධාරීන් කිහිපදෙනෙකු මගින් ඉටුවිය යුතු කාර්යයන් එකම නිලධාරියෙකු විසින් ඉටුකිරීම යන අඩුපාඩු නිරීක්ෂණය විය.

2.2.7 අයවැය පාලනය

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද 2010 ආදායම් ගිණුම් හා අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් උපයා තිබූ වාහන කුලී හා අනෙකුත් මූලාශ්‍ර වල ආදායම යන විෂයයන් යටතේ ආදායම ඇස්තමේන්තු කිරීමට කටයුතු කර නොතිබූ අතර ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සංයුක්ත සැලැස්මේ ඇතුලත් කාර්යයක් වූ සමාලෝචිත වර්ෂය තුල රු.854,612 ක ආදායමක් උපයා තිබූ කෙටිකාලීන පාඨමාලා ආදායම සම්පූර්ණයෙන් නොසලකා හැර තිබුණි.

(ආ) 2010 වසරේ විවෘත විශ්වවිද්‍යාලය උපයා තිබූ අභ්‍යන්තර ආදායම, ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රමාණය 51% කින් ඉක්මවා තිබුණි. 2009 වසරේ එය 27% කින් හා 2008 වසරේ 45% කින් ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවා තිබූ අතර අභ්‍යන්තර ආදායම අඩුවෙන් ඇස්තමේන්තු කිරීම සිරිතක් වශයෙන් සිදුකර තිබුණි.

03. **පද්ධති හා පාලන**

---------------------

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) මුද්‍රණාලයේ ගබඩා පාලනය

(ඈ) නඩත්තු අංශයට බාහිර කම්කරුවන් යෙදවීම

(ඉ) පාඨමාලා අත්පොත් බෙදාහැරීම

(ඊ) පාඨමාලා අයදුම්පත්‍ර අලෙවිය

(උ) තාවකාලික නේවාසිකාගාර පහසුකම් ලබා දීම.